**ධීවර ත්‍යාග අරමුදල - 2018**

**------------------------------------**

## 1.1 තත්ත්වාගණනය කළ මතය

**----------------------------------**

ධීවර ත්‍යාග අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, අරමුදලේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-----------------------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදලේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් අරමුදල විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ඉකුත් වර්ෂවලදී හා සමාලෝචිත වර්ෂය තුළදී නීත්‍යානුකූල කටයුතු අවසන් කර තිබූ නඩුවලට අදාළව දිස්ත්‍රික් ධීවර කාර්යාල, අධිකරණ හා නාවික හමුදාව භාරයේ ඇති යන්ත්‍ර හා උපකරණ අගය කර ගිණුම්ගත කිරීම සඳහා ප්‍රතිපත්ති හඳුනාගෙන නොතිබුණි. | මෙම භාණ්ඩ නීතිමය කටයුතු අවසන් කර රාජසන්තක කර අපවෙත භාරදෙන තෙක් දෙපාර්තමේන්තුවේ වත්කමක් නොවන බැවින් එම යන්ත්‍ර හා උපකරණවල වටිනාකම ගිණුම්ගත කිරීමට දෙපාර්තමේන්තුවට හැකියාවක් නොමැත . එබැවින් 2016 වසරේ සිට විගණනයේදී කරන ලද ඉල්ලීම අනුව මෙය සටහනක් ලෙස ඉදිරිපත් කරන ලදි. | ධීවර ත්‍යාග අරමුදල සතු සියලුම වත්කම් හඳුනාගැනීම සඳහා අවශ්‍ය ගිණුම් ප්‍රතිපත්ති සකස් කළ යුතු වේ. |

### 1.5.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2014 වර්ෂයේ දී ලැබී තිබුණු රු.433,200 ක් 2019 ජනවාරි මාසය තුලදී ත්‍යාග දීමනා වශයෙන් ගෙවා තිබුණි. එහෙත් ගෙවිය යුතු ත්‍යාග දීමනා හා ඒකාබද්ධ අරමුදලට ගෙවිය යුතු කොටස ගණනය කර ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි. | පවරනු ලබන නඩු කටයුතු අවසන් වී දෙපාර්තමේන්තුවට අවසන් නඩු තීන්දු ඇතුළත් වාර්තා ලැබීමෙන් පසුව ත්‍යාග දීමනා ගෙවීම් කරනු ලැබේ. ඒ අනුව විගණනයේ පෙන්වා දී ඇති නඩු කටයුතු අවසන්ව නොමැති බැවින් පසුගිය වර්ෂයට මෙම දීමනා ගෙවීම් කර නැත. රු.433,200 ට අදාල මුදල ලැබී ඇත්තේ 2014 වසරේදීය. එහෙත් මෙම මුදලට අදාල නඩු තීන්දු ලැබුණේ 2019 ජනවාරි මාසයේදී ය. එම වාර්තා ලද පසු ගෙවීම් කිරීමට කටයුතු කර රජයේ ආදායමට බැරකර ඇත. කෙසේ වුවද ඉදිරියේ දී උපචිත සම්පූර්ණ මුදලම ගිණුම්ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | ඒ ඒ වර්ෂයේ වැටලීම් කටයුතුවලට දායක වූ නිලධාරීන් සඳහා ගෙවිය යුතු දීමනා වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ගණනය කර ඒ ඒ වර්ෂයේ මූල්‍ය කාර්යසාධන වාර්තාවේ වියදමක් ලෙස ගිණුම්ගත කර වර්ෂයේ නිවැරදි තත්ත්වය මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කළ යුතුවේ. |
| (ආ) | 2018 කාර්යසාධන වාර්තාව අනුව 2018 වර්ෂයේ නිමවී නොතිබුණු නඩු 3 කට අදාලව ත්‍යාග අරමුදලට බැරවිය යුතු රු.113,470 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි. නිමවී තිබූ නඩු 11 කට අදාලව රු.27,740 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කළ අවසාන ගිණුම්වල තොරතුරු නිවැරදි බව දැනුම් දෙන අතර මෙය කාර්යසාධන වාර්තාවේ අඩුපාඩුවක් බව පෙනේ | ඒ ඒ වර්ෂවලට ලැබිය යුතු ආදායම් නිවැරදිව ගණනය කර ,ගිණුම්ගත කිරීමෙන් අරමුදලේ නිවැරදි තත්ත්වය එම මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කිරීමට අවශ්‍ය පියවර ගතයුතු වේ. |

### 1.6 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන 2013 වර්ෂයේ සිට පැවතගෙන එන රු.2,046,993 ක් වූ ලැබිය යුතු මසුන් අලෙවි ආදායමෙන් රු.1,528,073 ක් හෙවත් සියයට 75 ක් 2017 වර්ෂයට පෙර | අධිකරණවලින් දෙපාර්තමේන්තුවලට මෙම ආදායම් එවීම ප්‍රමාදවීම නිසා මෙම තත්ත්වය ඇති වී ඇත. | හිඟ ආදායම් අයකර ගැනීම කළ යුතුවේ. |

සිට ලැබිය යුතු මසුන් අලෙවි ආදායම් විය. සමාලෝචිත වර්ෂයේ දී 2017 වර්ෂයේ හිඟ ආදායම් වලින් රු.12,000 ක් පමණක් අය කරගෙන තිබුණෙන් හිඟ ආදායම් අයකර ගැනීම දුර්වල තත්ත්වයක පැවතුණි.

**1.7 නීති රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

නීති රීති, රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | 1996 අංක 02 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59(4) උප වගන්තිය | නිලධාරීන්ට හා තොරතුරු සපයන්නන්හට කලින් කලට සුදුසු යැයි අධ්‍යක්ෂවරයා සලකනු ලබන යම් මුදල් ප්‍රමාණයක් ත්‍යාග මුදල් ලෙස ලබාදීම සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි. | මේ සම්බන්ධයෙන් අදාල සියලුම නිලධාරීන් සමඟ සාකච්ඡා කර ගෙවිය යුතු මුදල් ප්‍රමාණ හා ගෙවිය යුතු අවස්ථාව පිළිබඳව ක්‍රමවේදයක් සකස් කිරීමට සටහන් කර ගතිමි. | වැටලීම් කරන නිලධාරීන් හා තොරතුරු සපයන්නන් දිරිමත් කිරීමට ප්‍රමාණවත් ත්‍යාග මුදල් ලබාදීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම ඉහළ කළමනාකරණයේ වගකීමක් වන අතර ඒ අනුව කටයුතු කළ යුතුවේ. |
| (ආ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 133 (i) හා 2011 දෙසැම්බර් 23 දිනැති අංක ඩී/එම්/ඒ/06 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | 2013 වර්ෂයේ සිට ත්‍යාග අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි. | අභ්‍යන්තර විගණන අංශයේ ප්‍රධාන කළමනාකරණ සහකරු හැරුණු විට අනෙකුත් සියලුම නිලධාරීන් නවක පත්වීම් ලැබූ පළපුරුද්ද ඉතා අඩු නිලධාරීන් වන බැවින් එම අංශයේ කටයුතු කරගෙන යාම අපහසු වී ඇත. | ත්‍යාග අරමුදල සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණනයක් ක්‍රියාත්මක කළ යුතුවේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.610,145 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.344,465 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.265,680 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට රාජසන්තක කරන ලද භාණ්ඩ හා මසුන් විකිණීමෙන් ලද ආදායම රු.265,680 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා**

**පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.**

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැටලීම් වලට සහභාගි වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළයුතු වුවත් 2014,2015,2016,2017 හා 2018 වර්ෂවල පිළිවෙලින් නඩු පැවරීම් 271,348,488,427 හා 327 ක් ලෙස සිදුකර තිබුණ ද 2014,2017,2018 වර්ෂ සඳහා කිසිදු මුදලක් ගෙවා නොතිබුණි. මේ අනුව නිලධාරීන් වෙත ත්‍යාග මුදල් ලබාදීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් සකස් නොකිරීම හේතුවෙන් නීති විරෝධි ධීවර කටයුතු වැටලීම සඳහා නිලධාරීන් දිරිගැන්වීමක් සිදු නොවන බව නිරීක්ෂණය විය. | විගණනයේ පෙන්වා දී ඇති පරිදි නඩු පැවරීම් කර ඇතත් එම නඩු කටයුතු අවසන් වීමට වසර ගණනාවක් ගතවීම නිසා එම වර්ෂයේ පවරන ලද නඩු සඳහා එම වර්ෂයේම ගෙවීම් කිරීමේ හැකියාවක් නැත.<br>සියළුම නඩුවල අවසන් තීන්දු දෙපාර්තමේන්තුවට වාසිදායක ලෙස ලැබී නොමැති නිසා ගෙවීම් සිදුවී නොමැත. එහෙත් වැටලීම් අඛණ්ඩව සිදුකරනු ලැබේ. සමස්තයක් ලෙස ගත්කළ 2017 හා 2018 වර්ෂවලද වැටලීම් සිදුකර ඇත. 2017 වර්ෂයේ වැටලීම් 52 ක් ද 2018 දී වැටලීම් 41 ක් ද සිදුකර ඇත. ඒ අනුව නිලධාරීන් අධෛර්ය වීමක් දක්නට නොමැත. | වැටලීම්වලට සහභාගි වූ නිලධාරීන්ට ත්‍යාග මුදල් ලබාදීම අප්‍රමාදව කළ යුතු වේ. |
| (ආ) | දිස්ත්‍රික් ධීවර කාර්යාල විසින් නීති විරෝධි ධීවර කටයුතුවල නියැලෙන්නන්ට විරුද්ධව නඩු පැවරීම තුළින් අධිකරණය විසින් දඩ මුදල් ලෙස රු.2,232,000 ක් සමාලෝචිත වර්ෂය තුළ චූදිතයන්ගෙන් අයකර ගෙන තිබුණි. එහෙත් අයකර ගනු ලබන දඩ මුදලින් කිසිදු ප්‍රතිශතයක් ධීවර ත්‍යාග අරමුදලට ලබාගැනීම සඳහා ධීවර හා ජලජ සම්පත් පනතේ කරුණු සංශෝධනය කර නොගැනීම හේතුවෙන් එම දඩ ආදායමෙන් කොටසක් ධීවර ත්‍යාග අරමුදලට ලබාගැනීමට නොහැකි වී තිබුණි. | ධීවර නිලධාරීන් විසින් පවරනු ලබන නඩුවලදී අධිකරණය විසින් පවරනු ලබන දඩ මුදල් ධීවර ත්‍යාග අරමුදලට බැරකිරීම සඳහා 2011 වර්ෂයේ දී පනත් කෙටුම්පතට ඇතුලත් කරන ලදී. මෙම පනත් කෙටුම්පත ගෙන ඒමේ මුඛ්‍ය පරමාර්ථය වුයේ ශ්‍රී ලංකාව අත්සන් කරනු ලැබූ අන්තර්ජාතික කලාපීය ගිවිසුම්වලට බලාත්මකභාවය ලබාදීමයි. දඩ මුදල් ඇතුළත් කිරීම සඳහා 59 වන වගන්තිය සංශෝධනය කිරීමේ දී සියලුම පළාත් සභාවල අනුමැතිය ලබාගත යුතු බැවින් පනත් කෙටුම්පත සම්මත කිරීම සඳහා | ධීවර හා ජලජ සම්පත් පනතේ දැක්වෙන අරමුණු ඉටුකර ගැනීම සඳහා ධීවර ත්‍යාග අරමුදල ශක්තිමත් කර වැටලීම් කරන නිලධාරීන්ට ප්‍රමාණවත් දීමනාවක් ගෙවීමට අවශ්‍ය ක්‍රමවේද සකස් කිරීම ඉහළ කළමනාකරණයේ අවධානය යොමු විය යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | | දීර්ඝ කාලයක් ගතවේ. යුරෝපීය කොමිසමට අයත් රටවලට මසුන් අපනයනය කිරීමෙන් ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ විනිමය අහිමිවීම වැළැක්වීම සඳහා කෙටුම්පතේ අනෙකුත් වගන්තිවලට ප්‍රමුඛතාවය ලබාදීම අවශ්‍ය විය. | |
| (ඇ) | ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් නීති විරෝධී ධීවර කටයුතුවල නියැලෙන්නන්ට විරුද්ධව පවරා තිබූ නඩු සම්බන්ධයෙන් වූ නඩු වාර්තා ලබාගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර නොතිබුණි. මේ සම්බන්ධයෙන් 2014 වර්ෂයේ සිට විගණන වාර්තා මඟින් පෙන්වා දී තිබුණත් ඒ කෙරෙහි අවධානය යොමු කර නොතිබුණි. | දිස්ත්‍රික් සහකාර අධ්‍යක්ෂවරුන් විසින් අදාල නඩු වාර්තා ලබාගැනීමට නිරන්තරයෙන් පියවර ගන්නා බව කාරුණිකව දැනුම් දෙමි. | නඩු වාර්තා ලබාගැනීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කළ යුතු වේ. |
| (ඈ) | තහනම් දැල් ආම්පන්න භාවිතා කරමින් නීති විරෝධී ධීවර කටයුතුවල නියැලෙන ධීවරයින් හා යාත්‍රා ධීවර නිලධාරීන් නිදහස් කරන බව නාවික හමුදාව වරින්වර ධීවර හා ජලජ සම්පත් සංවර්ධන අමාත්‍යාංශය දැනුවත් කර තිබුණි. නිරන්තරව රාජකාරියේ යෙදී සිටින නාවික හමුදාව අත්අඩංගුවට ගන්නා ලද ධීවර යාත්‍රා සඳහා අදාල දිස්ත්‍රික් ධීවර කාර්යාලයට දැනුම් දුන්නත් ඔවුන් බොහෝවිට නොපැමිණීම හෝ ප්‍රමාද වී පැමිණීම හෝ ධීවර යාත්‍රා නිදහස් කිරීම හෝ සිදුවන බව ද වාර්තා කර තිබුණි. එහෙත් ඒ සම්බන්ධයෙන් කිසිදු පියවරක් හෝ පරීක්ෂණයක් පවත්වා නොතිබුණු අතර නීති විරෝධී ක්‍රියා හේතුවෙන් අත්අඩංගුවට ගන්නා ලද යාත්‍රා කිසිදු අධිකරණ නියෝගයකින් තොරව නිදහස් කිරීම මඟින් නීති විරෝධී ක්‍රියාවන් සඳහා අනුබලදීමක් මෙන්ම රජයේ ආදායම් අහිමි කිරීමක් ද වන බව විගණනයේ අදහසයි. | දෙපාර්තමේන්තුවේ විමර්ශන අංශයක් අලුතින් පිහිටුවා ඇති බැවින් හැකි සෑම විටම මෙවැනි චෝදනා සම්බන්ධයෙන් එම අංශය මඟින් පරීක්ෂණ පැවැත්වීමට 2019 වර්ෂයේ සිට කටයුතු කර ඇත. | ශ්‍රී ලංකාවේ වටිනාම සම්පතක් වන ධීවර හා ජලජ සම්පත් අවිධිමත්ව ප්‍රයෝජනයට ගන්නා පාර්ශව අවම කිරීම සඳහා වැටලීම්වලට සහභාගීවන නිලධාරීන් දිරිමත් කිරීම සඳහා ප්‍රමාණවත් දීමනා කඩිනමින් ගෙවීම ප්‍රමාණවත් ක්‍රමවේද සකස් කිරීම කළමනාකරණය විසින් කළ යුතු වේ. |

**4.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**4.1** **වාර්ෂික ක්‍රියාකාරි සැලැස්ම**

**පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1996 අංක 2 දරන ධීවර හා ජලජ සම්පත් පනතේ 59 (3) වගන්තිය අනුව 51(4) උප වගන්තිය ප්‍රකාරව ත්‍යාග අරමුදලේ පරිපාලනය සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා වගකිව යුතු වුවද ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2017 හා 2018 වර්ෂ සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරි සැලසුම්වල ත්‍යාග අරමුදලේ කාර්යයන් හඳුනාගෙන ඵලදායී ලෙස ඉටුකරගැනීම සඳහා සැලසුම්කර නොතිබුණි. | 2019 වර්ෂයේ ක්‍රියාකාරි සැලසුමට මෙම අරමුදලේ කාර්යයන් ද ඇතුලත් කරන ලෙසට අදාල නිලධාරීන්ට උපදෙස් දුනිමි. | ධීවර හා ජලජ සම්පත් පනතේ 59 (3) වගන්තිය අනුව 51(4) උප වගන්තිය ප්‍රකාර ත්‍යාග අරමුදලේ කාර්යයභාරයන් හඳුනාගෙන එය ඵලදායී ලෙස ඉටු කිරීම සඳහා අවශ්‍ය සැලසුම් සකස් කර ක්‍රියාත්මක කළ යුතු වේ. |